# විල්කොට් නික්ම යෑම

ඩොමිනික් විල්කොට මහතා ලංකාවේ බ්‍රිතානි මහා කොමසාරිස් ලෙස කටයුතුකිරීමෙන් පසුව ඇමරිකන් එක්සත් ජනපදයේ බ්‍රිතානි නියෝජ්‍ය තානාපති ලෙස උසස්වීමක් ලබා මේ වසර අවසානයේ දී මෙරටින් නික්ම යයි. ඒ වෙනුවෙන් අපෙන් ඒ මහතාට සුබ පැතීමක් නැත. ඒ මහතා විසින් මෙරට දී කරන ලද සේවය වෙනුවෙන් බ්‍රිතානි විදේශ අමාත්‍යංශයෙන් උසස්වීමක් ලැබී ඇත. ඇමරිකාවේ නියෝජ්‍ය තානාපතිකම ලංකාවේ මහා කොමසාරිස්කමට වඩා උසස් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

විල්කොට මහතා ඇමරිකාවේ දී එරට දේශපාලනයට ඇඟිලි ගැසීමට නොයන බව අපට විශ්වාස ය. ඇමරිකාව ද කලක් බ්‍රිතානියේ යටත්විජිතයක් විය. ඒ බ්‍රිතානියේ යටත්විජිතයකට වඩා යටත්විජිත කිහිපයක් විය. ඇමරිකන් එක්සත් ජනපද නමින් රටක් රාජ්‍යයක් බිහිවූයේ ඒ යටත්විජිත එක්වී බ්‍රිතානියට විරුද්ධව කරන ලද නිදහස් සටනකින් පසුව සන්ධීය රාජ්‍යයක් ගොඩනගා ගැනීමෙනි. මෙරට සිටින සන්ධීයවාදීන් නොකීවාට ලෝකයේ සන්ධීය රාජ්‍යය සියල්ල ම පාහේ බිහිවී ඇත්තේ එසේ වෙන ම තිබූ රාජ්‍ය කිහිපයක් එක්වීමෙන් පසුව ය. එසේ නොමැතිව බිහිවූ සන්ධීය රාජ්‍යය වන බෙල්ජියම අද දෙකඩ වන තත්වයකට ක්‍රමයෙන් පත්වෙමින් ඇත.

කලක් බ්‍රිතානි යටත්විජිත ලෙස පැවතුණ ද ඇමරිකාවේ දී විල්කොට මහතා ලංකාවේ දැක්වූ ශිල්ප දැක්වීමට නොයනු ඇත. එයට හේතු ගණනාවක් ම වෙයි. පළමු හේතුව අද ඇමරිකාව බ්‍රිතානියට වඩා බලසම්පන්න වී තිබීම ය. එසේ නැතත් ඇමරිකාවේ පාලකයන්ට එම රට ගැන ආඩම්බරයක් ඇත. විල්කොට මහතා ඇමරිකාවේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමට ගියහොත් ඒ මහතාට සිදුවන්නේ කුමක් ද යන්න වඩාත් ම හොඳින් දන්නේ ඒ මහතා ය.

මෙයින් අදහස් කරන්නේ මෙරට වත්මන් පාලකයන්ට රට ගැන ආඩම්බරයක් නැති බව නො වෙයි. රනිල් වික්‍රමසිංහ මහතා වැන්නකුට ආඩම්බරයක් ඇත්තේ බ්‍රිතානිය හා ඇමරිකාව ගැන වුවත් මහින්ද රාජපක්ෂ මහතාට ලංකාව ගැන ආඩම්බරයක් ඇති බව ඒ මහතා පසුගිය දිනවල ක්‍රියාකර ඇති ආකාරයෙන් නිගමනය කළ හැකි ය. (වික්‍රමසිංහ මහතාගේ පක්ෂයේ ජයලත් ජයවර්ධන තිස්ස අත්තනායක ආදීන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා ඇමරිකාවේ දී පැවැත්වූ එ ජා ප ශාඛා රැස්වීමට සහභාගි වූ පනහකට අඩු පිරිස අතර කොටි හිතවත් ඥානකෝන් කෙනකු ද සිටි බව වාර්තා වෙයි.) විල්කොට් මහතා ගැන ලංකාණ්ඩුව ඉතා ඉවසීමෙන් කටයුතු කර ඇති බව පෙනෙයි. සමහරවිට එයට හේතුව වන්නට ඇත්තේ විල්කොට මහතා ටික දිනකින් මෙරටින් නික්ම යෑමට තිබීම විය හැකි ය. ටික කලකින් යන මිනිහාට විරුද්ධව දැඩි පියවර ගැනීමේ අවශ්‍යතාවක් නැතැයි ලංකාණ්ඩුව සමහරවිට සිතන්නට ඇත.

එහෙත් එහි තවත් පැත්තක් තිබේ. විල්කොට මහතාට විරුද්ධව කටයුතු කිරීමෙන් බ්‍රිතානිය අමනාප වේයැයි ද, බ්‍රිතානිය විල්කොට මහතාගේ කතාවලට වගකිව යුතු නැතැයි ද ඇතැම් විට ලංකාණ්ඩුව සිතන්නට ඇත. ඒ එසේ නම් එහි වරදක් වෙයි. පසුගිය දා ඩඩ්ලි සේනනානායක අනුස්මරණ දේශනයේ දී විල්කොට මහතා පළකළ අදහස් ඒ මහතාගේ පෞද්ගලික අදහස් නොවන බවත් ලංකාවේ බ්‍රිතානි මහා කොමසාරිස් කාර්යාලය ඒ සියල්ල අනුමත කරන බවත් එකී කාර්යාලය මගින් නිකුත් කරන ලද ප්‍රකාශයකින් කියැවිණි.

අප තේරුම්ගත යුතු කරුණක් නම් විල්කොට මහතා වැන්නවුන් දේශපාලන ඔනෑ එපාකම නිසා තානාතිවරුන් නොවූ බවත් ඔවුන් වෘත්තීය තානාපතිවරුන් බවත් ය. වෘත්තීය තානාපතිවරයා කරන ප්‍රසිද්ධ ප්‍රකාශ රට වෙනුවෙන් කරන ප්‍රකාශ වෙයි. ඔවුන්ට ලැබෙන පුහුණුවෙහි දී තම පෞද්ගලික මත ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකිරීමට උපදෙස් ලැබෙනු ඇතැයි සිතිය හැකි ය. නැතත් සම්මත රාජ්‍ය තාන්ත්‍රික චාරිත්‍ර වාරිත්‍ර අනුව ඒ එසේ ම ය. විල්කොට් මහතා මෙරට දී කරන ලද සියළු ප්‍රසිද්ධ ප්‍රකාශ බ්‍රිතානි රජයේ ප්‍රතිපත්තිවලට එකඟ ය. ඒ පිළිබඳ අපට කිසිම සැකයක් නොතිබිය යුතු ය.

එබැවින් බ්‍රිතානි රජය අමනාප නොකරගැනීම සඳහා ලංකාණ්ඩුව විල්කොට මහතාට විරුද්ධව පියවර නොගෙන සිටියේ නම් ඒ වරදකි. විල්කොට මහතාට මෙන් ම බ්‍රිතානියට ද පාඩම් ඉගැන්වීමට තිබුණේ විල්කොට මහතා නොමනා පුද්ගලයකු ලෙස ප්‍රකාශ කිරීමෙන් ය. කවර හේතුවක් නිසා ඒ එසේ නොවිණි දැයි නො දනිමි. එසේ නොකිරීම

© Prof. Nalin De Silva

සම්බන්ධයෙන් නම් අපට ඇත්තේ කණගාටුවකි. නික්ම යෑමට දවසක් තිබිය දී වත් විල්කොට් මහතා නොමනා පුද්ගලයකු ලෙස ප්‍රකාශකිරීම රටේ අභිමානයට ම හේතු වනු ඇත.

විල්කොට් මහතා වෙනුවට පත්ව එන්නේ කවුරුන් දැයි අපි නො දනිමු. ඔහු හෝ ඇය හෝ කවරකු වුවත් කටයුතු කරනු ඇත්තේ බ්‍රිතානි ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ඇතැම් විට නව මහා කොමසාරිස් හැකිතාක් ප්‍රසිද්ධ ප්‍රකාශකිරීමෙන් වළකිනු ඇත. එහෙත් ඉන් කියැවෙන්නේ බ්‍රිතාන්‍ය තම ප්‍රතිපත්තිය වෙනස්කර ඇති වගක් නොවන බව පැහැදිලි කරගත යුතු ය. අප එක් අතකින් විල්කොට් මහතාට ස්තුතිවන්ත විය යුතු ය. ඒ බ්‍රිතානි ප්‍රතිපත්තිය මේ යැයි අපට ප්‍රසිද්ධියේ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ය.

විල්කොට් මහතා වෙනත් බොහෝ තානාපතිවරුන් මෙන් නොව ප්‍රසිද්ධියේ ම මෙරට දේශපාලනයට හවුල් විය. ඒ මහතා මෙරට දේශපාලනයට හවුල් වුයේ තම රට වෙනුවෙන් බව අමතක නොකළ යුතු ය. සෑම බ්‍රිතානි තානාපතිවරයකු ම එසේ මැදිහත් නොවනු ඇත. එහෙත් බ්‍රිතානි ප්‍රතිපත්තිය මෙරට සිංහලත්වය නැසීම ය. එසේ නොහැකි නම් මෙරට සිංහලත්වය බෙලහීන කිරීම ය. විල්කොට් මහතා තම රට වෙනුවෙන් තම යුතුකම් කොටස මනාව ඉටු කෙළේ ය. එහි දී ඔහුට අනගි සහායක් ලබාදුන් පුද්ගලයෙක් වෙයි. ඒ අන් කිසිවකු නොව මෙරට ඇමරිකානු තානාපති බ්ලේක් මහතා ය. බ්ලේක් විල්කොට් යුවළ රයිගමයා හා ගම්පලයා මෙන් ක්‍රියා කළහ. විල්කොට් මහතා නික්ම යෑමෙන් පසුව නැතිවන්නේ රයිගමයා ද ගම්පලයා ද යන්න නම් ප්‍රශ්නයකි.

අවශ්‍ය වූ විට විල්කොට් මහතා පුවත්පත් ප්‍රකාශ නිකුත් කෙළේ ය. ඒ එසේ තිබිය දී මෙරට ඇතැම් සංවිධාන ඔහුට ප්‍රසිද්ධ දේශන සඳහා ආරාධනා කෙළේ ය.  රට පැත්තෙන් බැලූ කල ඒ ඉල්ලන් කෑමක් විය. එසේ ඉල්ලන් කෑමට රටට අවශ්‍ය නැත. එහෙත් තමන් සමාජයේ ඉහළින් ඉන්නො යැයි සිතන ඇතැම්හු විල්කොට් මහතාට තම සංවිධාන ඇමතීමට අවස්ථාව ලබා දුන්හ. එසේ අවස්ථාව ලබාදීමෙන් ඔවුන් පෙන්නුම් කෙළේ තම නිවටකම මිස අන්කිසිවක් නො වෙයි. මෙරට සමාජයෙහි ඉහළින් සිටින්නේ යැයි සිතන්නවුන් හා කියන්නවුන් අතර පහත් ම ගණයේ නිවටයෝ වෙති. බ්‍රිතානි මහා කොමසාරිස්වරයා සමග එකට ඡායාරූපයකට පෙනී සිටීම ඔවුන් ජීවිතයේ ලබන පරම සතුටට හේතුව විය හැකි ය.

විල්කොට් මහතා අවසන් වරට මෙරට කරන ලද දේශනය ඩඩ්ලි සේනානායක අනුස්මරණ දේශනය විය. එහි දී ඔහු කියා සිටියේ ප්‍රභාකරන්ගේ පිළිවෙත අනුමත කළ නොහැකි වුවත් වෙන ම රාජ්‍යයක් පිහිටුවමට නීත්‍යානුකූල අයිතියක් ඇති බව ය. මෙය බ්‍රිතානි රජයේ ප්‍රතිපත්තිය බව නැවතත් අවධාරණය කළ යුතු ය. බ්‍රිතාන්‍ය ප්‍රභාකරන් හෝ වෙනත් අයකු හෝ නැති වූ පමණින් තම ව්‍යාපෘතිය අත්නොහරිනු ඇත. බ්‍රිතාන්‍ය තමන්ගේ වැඩි දායකත්වයෙන් ඇති කළ ප්‍රශ්නයට තමන්ගේ ම සහ සන්ධීය රාජ්‍ය විසඳුම ලබාදීමට උත්සාහ ගනියි.

ඒ කෙසේ වෙතත් කොළඹ දී ප්‍රධාන වශයෙන් ම මෙරට ජීවත්වන යටත්විජිතවාදී මනස් ඇත්තවුන් හේතුකොටගෙන විල්කොට් මහතා ගණන්ගතයුතු පුද්ගලයෙක් විය. එහෙත් ඔහු වොෂිංටනයේ දී නිකමකු වනු ඇත. තුන්වැනි පංතියේ සමාජීය විද්‍යාඥයකුට හෝ විද්‍යාඥවරියකට හෝ තම ව්‍යාජ පාණ්ඩිත්‍යය ප්‍රදර්ශනය කිරීමට ගණන්ගත්තකුගේ සිට නිකමකු දක්වා යන මැයෙන් පොතක් ලිවිය හැකි ය. මෙවැනි පොත්වල සිද්ධි පිළිබඳ විශ්ලේෂණයක් වේ යැයි මේ පඬියෝ කියති. එහෙත් ඒවාහි ඇත්තේ හුදෙක් සිද්ධි විස්තර කිරීමක් පමණක් බව විශ්ලේෂණය යනු කුමක් දැයි දත්තෝ දනිති. විල්කොට් මහතා වැන්නවුන් ගණන්ගන්නවුන් බවට පත්වන්නේ ද මෙවැනි සමාජීය විද්‍යාඥයන්ට හා විද්‍යාඥවරියනට පින් සිදුවන්නට ය. එමෙන් ම එවැනි පඬියන්ට ලංකාවේ තැනක් ලැබෙන්නේ ද විල්කොට් මහතා වැන්නවුන් හා බටහිර විශ්වවිද්‍යාලවල සේවය කරමින් එවැන්නන්ට ප්‍රසිද්ධියක් ලබාදෙන බටහිර සමාජ විද්‍යාඥයන් හා විද්‍යාඥවරියන් නිසා ය. ඔවුනොවුන්ට එකිනෙකා අවශ්‍ය වෙයි. අගත අනගත (පැමිණි නො පැමිණි) සියළු විල්කොට්ලා වර්ජනය (බෝයිකොට්) කිරීම අපේ ප්‍රතිපත්තිය විය යුතු ය. නොඑසේ නම් ජාතියක් ලෙස ගත්කල ඒ අපේ නොනගතය වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva